# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2062/13 - 2018 මාර්තු මස 13 වැනි අඟහරුවාදා - 2018.03.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 25 වැනි වගන්තිය යටතේ රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත රජයේ ඉඩමක් පවරා ගැනීම**

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 25 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස වන මම මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කරනු ලබන රජයේ ඉඩම රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව වෙත මින් පවරා දෙමි.

සජිත් ප්‍රේමදාස,
නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය.

2018 මාර්තු 06 දින,
නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල,

උපලේඛනය

1. බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පැලියගොඩ නගර සභා බල සීමාව තුල කොට්ඨාස අංක 6 සහ 7 හි පැලියගොඩ යන ගම පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සම්පාදිත අංක ගම් 3554 සහ 2006-11-18 දිනැති පිඹුරේ සඳහන් කැබලි අංක 1 සඳහා මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | පරාක්‍රම මාවත සහ මු. පි. ගම් 3399 හි කැබලි අංක 116 ද, |
| නැගෙනහිරට | : | මු. පි. ගම් 3399 හි අංක 117 සහ රජයට අයත් මීගමු පාරේ වරිපනම් අංක 322/7 දරන ඉඩම ද, |
| දකුණට | : | කැළණි ගඟද, |
| බස්නාහිරට | : | එච්. පී. සද්ධාතිස්ස කල්දේරා හිමිකම් කියන පරාක්‍රම මාවතේ වරිපනම් අංක නොදත් ඉඩමද, |

යන මායිම් තුල පිහිටි හෙක්ටයාර බින්දුවයි දශම එකයි දෙකයි තුනයි තුනක් (0.1233 ක්) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ඇතුළු සියලු දේ වේ.


1A - G 27283 — 19 (2018/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2. ඉහත කී පැලියගොඩ යන ගම පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සම්පාදිත අංක ගම් 3554 සහ 2006-11-18 දිනැති පිඹුරේ සඳහන් කැබලි අංක 2 මායිම්,

| | | |
|---|---|---|
| උතුරට | : | මු. පි. ගම් 3399 හි කැබලි අංක 119 සහ 120 ද, |
| නැගෙනහිරට | : | මු. පි. ගම් 3399 හි කැබලි අංක 122 සහ දොස්තර පතිර් හිමිකම් කියන නුවර පාරේ වරිපනම් අංක 202 දරන ඉඩමද, |
| දකුණට | : | කැළණි ගඟ ද, |
| බස්නාහිරට | : | හිමිකම් කියන්නා සොයාගත නොහැකි නුවර පාරේ වරිපනම් අංක නොදත් ඉඩම සහ මු. පි. ගම් 3399 හි කැබලි අංක 119 ද, |

යන මායිම් තුල පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම බින්දුවයි හතයි හතයි දෙකක් (0.0772 ක්) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි ගහකොළ, පලතුරු, ගොඩනැගිලි ඇතුළු සියලු දේ වේ.

03-1131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.